GMOA
TU No. 291
ESTABLISHED IN 1926
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

09-02-2012

මාධ්‍ය නිවේදනය

විශේෂඥ වෛද්‍යවරු රට හැර යාම

විදේශ පුහුණුව නිම කිරීමෙන් පසු, දියුණු රටවල නතර නොවී මෙරටට එන විශේෂඥ වෛද්‍යවරු සිය දරුවන් නැවත රජයේ විදුහල් වලට ඇතුල් කරගත නොහැකිව ගැටළුසහගත තත්ත්වයකට මුහුණ දී ඇත. මේ හේතුවෙන් 2003 වනතෙක් ලංකාවේ විශේෂඥ වෛද්‍යවරු සංඛ්‍යාව වැඩිකර ගැනීමට නොහැකි විය. රට ගැන ආදරයක් ඇති මෙම වෛද්‍යවරු නැවත සියරට පැමිණි පසු දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට නොහැකි වුයෙන් රට හැර යාම අතීතයේ සිදුවිය.

2003 වසරේ කරන ලද යෝජනාවක් අනුව 2005 වසරේ කැබිනට් මණ්ඩලය අදාල දරුවන්ට ජාතික පාසල් ලබා දීම නිසා පසුගිය කාලය තුල රට තුල රැඳෙන විශේෂඥ වෛද්‍යවරු සංඛ්‍යාව ඉහළ යාම පැහැදිලිව දක්නට ලැබුණි. දුෂ්කර ප්‍රදේශවලට විශේෂඥ වෛද්‍යවරු ලැබීම නිසා එම ප්‍රදේශවල ජනතාවට මහත් අස්වැසිල්ලක් ගෙන දුනි.

නමුත් මෑතක සිට අධ්‍යාපන අමාත්‍යංශයේ වෛද්‍යවරු නොරැස්සන ආකල්ප නිසා බොහෝ වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලැබී නැත. අතිගරු ජනාධිපතිතුමාට මේ බව දැන්වූ පසු පාසල් ලබා දීම සඳහා කටයුතු කිරීමට අධ්‍යාපන අමාත්‍යංශයට උපදෙස් දෙන ලදී.

සිය දරුවන් රජයේ විදුහල් වලට ඇතුලත් කර ගත නොහැකිව සමහර වෛද්‍යවරු මාස 10 පමණ බලා සිටි. මින් දැඩිකලකිරීමට පත් වූ විශේෂඥ වෛද්‍යවරු කිහිපදෙනෙක් පසුගිය සති 4 ඇතුලත රට හැර ගොස් ඇත.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩි විස්තර -	වෛද්‍ය සමන් අබේවර්ධන	0717356141
	වෛද්‍ය නලින් ආරියරත්න	0714800942
	වෛද්‍ය නවීන් ද සොයිසා	0718582444